# සත්තමො පාඨො

## සඛායො

අථේ'කො බාරාණසිවාසිකො මනුස්සො වනං පවිට්ඨො තථේ'ව පානීයං පරියෙසමානො තං ඨානං පත්වා තෙ තයො'පි දිස්වා කම්පමානහදයො වල්ලියා පිටකං බන්ධිත්වා සික්කාය'පි පක්ඛිපිත්වා ඔතාරෙත්වා තෙ තයො'පි උද්ධරි, අථා'නෙන තෙ අම්හාකං ජීවිතං දින්නන්ති සොමනස්සා තස්සෙවමාහංසු, සාමි, මයං තුම්හෙ නිස්සාය ජීවිතං ලභිම්හ, තුම්හෙ ඉතො පට්ඨාය අම්හාකං සහායො, මයම්පි තෙ සහායා, අම්හාකං වසනට්ඨානානි ආගන්තුකාමොති වත්වා තෙසු තාව සුවපොතකො ආහ, සාමි බාරාණසියං දක්ඛිණද්වාරෙ මහානිග්‍රොධො අත්ථි, තත්ථාහං වසාමි. තව තථාරූපෙ කිච්චෙ සති මම සන්තිකමාගම්ම සුවං ඉති සද්දං කරොහී'ති වත්වා මෙත්තිං ථිරං කත්වා පක්කාමි. සප්පො'පි සම්මාහං තස්සෙ'ව නිග්‍රොධස්සාවිදූරෙ මහන්තං වම්මිකං අත්ථි, තත්ථ වසාමි. තවත්ථෙ සති තත්ථ ගන්ත්වා දීඝා'ති, සද්දං කරොහී'ති වත්වා තථෙව පක්කාමි. මනුස්සො'පි බාරාණසියං අසුකාය නාම වීථියා අසුකගෙහෙ වසාමි. තවත්ථෙ සති මම සන්තිකං ආගච්ඡා'ති වත්වා පක්කාමි.

**(රසවාහිනී, ජම්බුදීපුප්පත්තිකථා)**

පද මාලාව

| | | | |
|---|---|---|---|
| **තථෙව** | (සං) | - | එසේ ම |
| **පරියෙසමානො** | (කි) | - | සොයන්නේ |
| **තයොපි** | (සං) | - | තුන්දෙනා ම |
| **දිස්වා** | (පූ.ක්‍රි) | - | දැක |
| **කම්පමානහදයො** | (ස) | - | කම්පාවන හදවත් ඇත්තේ |
| **වල්ලියා** | (නා) | - | වැලෙන් |
| **පිටකං** | (නා) | - | කූඩයක් |
| **සික්කාය** | (නා) | - | සාල්ලක |
| **පක්ඛිපිත්වා** | (පූ.ක්‍රි) | - | බහා |
| **උද්ධරි** | (ක්‍රි) | - | ගොඩ ගත්තේය |
| **අනෙන** | (ස.නා) | - | මොහු විසින් |
| **දින්නන්ති** | (සං) | - | දෙන ලදැයි |
| **නිස්සාය** | (නි) | - | නිසා |
| **පට්ඨාය** | (පූ.ක්‍රි) | - | පටන් |
| **සහායො** | (නා) | - | මිත්‍රයා/ සහායකයා |
| **වසනට්ඨානානි** | (සං) | - | වසන තැන් |
| **ආගන්තුකාමො** | (කි) | - | එනු කැමැත්තේ |
| **තාව** | (නි) | - | පළමු කොට |

| | | | |
|---|---|---|---|
| **ආහ** | (ක්‍රි) | - | කීවේය |
| **තත්ථාහං** | (සං) | - | එහි, මම |
| **සන්තිකමාගම්ම** | (සං) | - | සමීපයට පැමිණ |
| **කරොහි** | (ක්‍රි) | - | කරන්න |
| **තවත්ථො** | (සං) | - | ඔබට වැඩක් |
| **සති** | (නි) | - | ඇති කල්හි |
| **ආගච්ඡාති** | (සං) | - | එන්න යැයි |

**අභ්‍යාස**

1. ‘සඛායො’ ඡේදය සිංහලට නගන්න.
2. ඡේදය ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. කො තං ඨානං පාවිසි?
ii. සො කෙ පස්සි?
iii. සො කෙන පිටකං බන්ධි?
iv. සො කිමත්ථාය වනං පාවිසි?
v. අම්හාකං ජීවිතං දින්නන්ති කෙ ආහංසු?
vi. කෙ සොමනස්සා අහෙසුං?

## ආඛ්‍යාත විභක්ති III

වර්තමාන, අනාගත, අතීත ක්‍රියා ප්‍රකාශ කිරීමට පිළිවෙළින් **වත්තමානා, භවිස්සන්ති, අජ්ජතනී** යන ආඛ්‍යාත විභක්ති භාවිත වෙයි. ආශීර්වාද කිරීම් සඳහා පඤ්චමී ආඛ්‍යාත විභක්තිය ද අනුමති හා පරිකල්පාර්ථ ප්‍රකාශ කිරීමට සත්තමී ආඛ්‍යාත විභක්තිය ද භාවිත වේ. මෙකී ආඛ්‍යාත විභක්තිවලට අමතර ව අතීත කාල ක්‍රියා සිද්ධියක් ප්‍රකාශ කිරීම සඳහා තවත් ආඛ්‍යාත විභක්ති දෙකක් භාවිත වේ. එනම් **පරොක්ඛා** ආඛ්‍යාත විභක්තිය හා **හීයත්තනී** ආඛ්‍යාත විභක්තිය යි. එම ආඛ්‍යාත විභක්ති දෙකෙහි ප්‍රත්‍යයමාලා හා වරනැඟීම් සිදුවන අයුරු තේරුම් ගනිමු.

### පරොක්ඛා ආඛ්‍යාත විභක්තිය

පරොක්ඛා ආඛ්‍යාත විභක්තිය අතීත කාලාර්ථයක් ප්‍රකාශ කිරීම සඳහා භාවිත වේ. ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂ නො වූ (නො දුටු) අතීත කාලය කිවයුතු විටක දී හෝ ඇසූ දෙයක් කීමේ දී (ශ්‍රැති සූචනාර්ථයේ) **පරොක්ඛා** ආඛ්‍යාත පද යෙදේ. ධාතුවේ මුල් අක්ෂරය ද්විත්ව වීමත් **ව්‍යඤ්ජනාදික ආඛ්‍යාත** ප්‍රත්‍යය යෙදුණු විට, ඉකාරයක් ආගම වීමත් මෙම ආඛ්‍යාත විභක්තියේ දැකිය හැකි ය. **(අපච්චක්ඛෙ පරොක්ඛාතීතෙ) අ, උ, එ, ත්ථ, අ, ම්හ** යන ප්‍රත්‍යය පරස්සපදයේත් **ත්ථ, රෙ, ත්ථො, ව්හො, ඉ, ම්හෙ** යන ප්‍රත්‍යය අත්තනොපදයෙත් භාවිත වේ.

නො දුටු අතීතය :-

අතීතෙ ලඞකායං රාවණො නාම රාජා බභූව.

(පෙර ලංකාවේ රාවණ නම් රජෙක් වීලු)

ශ්‍රැති සූචනාර්ථය :-

සා තං පවත්තිං සුත්වා රුරොද.

(ඕතොමෝ ඒ පුවත අසා හැඬුවාලු)

### පරොක්ඛා පරස්සපද

| පුරුෂය | ඒකවචන | | | බහුවචන | | |
|---|---|---|---|---|---|---|
| | සර්වනාම | ප්‍රත්‍යය | ආඛ්‍යාත පදය | සර්වනාම | ප්‍රත්‍යය | ආඛ්‍යාත පදය |
| පඨමපුරිස | සො | අ | පපච | තෙ | උ | පපචු |
| මජ්ඣිමපුරිස | ත්වං | එ | පපචෙ | තුම්හෙ | ත්ථ | පපචිත්ථ |
| උත්තමපුරිස | අහං | අ | පපච | මයං | මහ | පපචිමහ |

| පුරුෂය | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨමපුරිස | පිසුවෙලු | පිසුවාහුලු |
| මජ්ඣිමපුරිස | පිසුවෙහිලු | පිසුවෙහුලු |
| උත්තමපුරිස | පිසුවෙම්ලු | පිසුවෙමුලු |

### පරොක්ඛා අත්තනොපද

| පුරුෂය | ඒකවචන | | | බහුවචන | | |
|---|---|---|---|---|---|---|
| | සර්වනාම | ප්‍රත්‍යය | ආඛ්‍යාත පදය | සර්වනාම | ප්‍රත්‍යය | ආඛ්‍යාත පදය |
| පඨමපුරිස | සො | ත්ථ | පපචිත්ථ | තෙ | රෙ | පපචිරෙ |
| මජ්ඣිමපුරිස | ත්වං | ත්‍සො | පපචිත්‍සො | තුම්හෙ |ව්හො | පපචිව්හො |
| උත්තමපුරිස | අහං | ඉ | පපචි | මයං | ම්හෙ | පපචිම්හෙ |

## හීයත්තනී ආඛ්‍යාත විභක්තිය

අතීත කාල ක්‍රියාර්ථයක් ප්‍රකාශ කිරීම සඳහා හීයත්තනී ආඛ්‍යාත විභක්තිය ද භාවිත වේ. ඊයේ දවසින් මත්තෙහි ඉන්ද්‍රිය විෂය වූ හෝ නො වූ අතීත ක්‍රියා දැක්වෙන්නේ **හීයත්තනී** ආඛ්‍යාත විභක්තියෙනි. ධාතුවට මුලින් අකාරයක් ආගම වීම මෙම ආඛ්‍යාතයේ විශේෂ ලක්ෂණය යි. **(හීයොප්පභුති පච්චක්ඛෙ හීයත්තනී)** **ආ, ඌ, ඔ, ත්ථ, අ, ම්හ** යන ප්‍රත්‍යය පරස්සපදයේත් **ත්ථ, ත්ථුං, සෙ, ව්හං, ඉං, ම්හසෙ** යන ප්‍රත්‍යය අත්තනොපදයේත් යෙදේ.

### හීයත්තනී පරස්සපද

| පුරුෂය | ඒකවචන | | | බහුවචන | | |
|---|---|---|---|---|---|---|
| | සර්වනාම | ප්‍රත්‍යය | ආඛ්‍යාත පදය | සර්වනාම | ප්‍රත්‍යය | ආඛ්‍යාත පදය |
| **පඨමපුරිස** | සො | ආ | අපචා | තෙ | ඌ | අපචූ |
| **මජ්ඣිමපුරිස** | ත්වං | ඔ | අපචො | තුම්හෙ | ත්ථ | අපචත්ථ |
| **උත්තමපුරිස** | අහං | අ | අපච | මයං | ම්හා | අපචම්හා |

| පුරුෂය | ඒකවචන | බහුවචන |
|---|---|---|
| **පඨමපුරිස** | පිසුවේය | පිසුවෝය |
| **මජ්ඣිමපුරිස** | පිසුවෙහි | පිසුවෙහු |
| **උත්තමපුරිස** | පිසුවෙමි | පිසුවෙමු |

### හීයත්තනී අත්තනොපද

| පුරුෂය | එකවචන | | | බහුවචන | | |
|---|---|---|---|---|---|---|
| | සර්වනාම | ප්‍රත්‍යය | ආඛ්‍යාත පදය | සර්වනාම | ප්‍රත්‍යය | ආඛ්‍යාත පදය |
| **පඨමපුරිස** | සො | ත්ථ | අපචත්ථ | තෙ | ත්ථුං | අපචත්ථුං |
| **මජ්ඣිමපුරිස** | ත්වං | සෙ | අපචසෙ | තුම්හෙ | ව්හං | අපචව්හං |
| **උත්තමපුරිස** | අහං | ඉං | අපචිං | මයං | ම්හසෙ | අපචම්හසෙ |

පහත දැක්වෙන වගු අධ්‍යයනය කරන්න.

**හීයත්තනී පරස්සපද**

| පඨමපුරිස | | මජ්ඣිමපුරිස | | උත්තමපුරිස | |
|---|---|---|---|---|---|
| එකවචන | බහුවචන | එකවචන | බහුවචන | එකවචන | බහුවචන |
| අදදා | අදදූ | අදදො | අදදත්ථ | අදද | අදදම්හා |
| අකරා | අකරූ | අකරො | අකරත්ථ | අකර | අකරම්හා |
| අයචා | අයචූ | අයචො | අයචත්ථ | අයච | අයචම්හා |
| අභවා | අභවූ | අභවො | අභවත්ථ | අභව | අභවම්හා |

**හීයත්තනී අත්තනොපද**

| පඨමපුරිස | | මජ්ඣිමපුරිස | | උත්තමපුරිස | |
|---|---|---|---|---|---|
| එකවචන | බහුවචන | එකවචන | බහුවචන | එකවචන | බහුවචන |
| අදදත්ථ | අදදත්ථුං | අදදසෙ | අදදව්හං | අදදිං | අදදම්හසෙ |
| අකරත්ථ | අකරත්ථුං | අකරසෙ | අකරව්හං | අකරිං | අකරම්හසෙ |
| අයචත්ථ | අයචත්ථුං | අයචසෙ | අයචව්හං | අයචිං | අයචම්හසෙ |
| අභවත්ථ | අභවත්ථුං | අභවසෙ | අභවව්හං | අභවිං | අභවම්හසෙ |

**අභ්‍යාස**

01. පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. "අපච්චක්ඛෙ පරොක්ඛාතීතෙ" යන්න පැහැදිලි කරන්න.
ii. හීයත්තනී ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය මාලාව වගුගත කර දක්වන්න.
iii. පරොක්ඛා ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය මාලාව වගුගත කර දක්වන්න.
iv. අජ්ජතනී, පරොක්ඛා හා හීයත්තනී ආඛ්‍යාත භාවිතයේ වෙනස පෙන්වා දෙන්න.
v. පරොක්ඛා හා හීයත්තනී ආඛ්‍යාත පද සහිත වාක්‍ය පහ බැගින් සොයා ලියන්න.

02. √චර ධාතුව පරොක්ඛා ආඛ්‍යාත විභක්තියේත් √ඛිණ ධාතුව සත්තමී ආඛ්‍යාත විභක්තියේත් උභයපදයෙහි වරනගා වගුගත කර දක්වන්න.

03. පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| වත්තමාන | භවිස්සන්ති | අජ්ජතනී | පඤ්චමී | සත්තමී | හීයත්තනී |
|---|---|---|---|---|---|
| ගච්ඡති | ගච්ඡිස්සන්ති | අගච්ඡි | ගච්ඡතු | ගච්ඡෙය්‍ය | අගච්ඡා |
| ලිඛති | | | | | |
| හසති | | | | | |
| චරති | | | | | |
| භවති | | | | | |
| වන්දති | | | | | |

04. පහත දැක්වෙන වාක්‍ය සිංහලට නගන්න.

i. එවං සො අත්තනො පවත්තිං කථෙසි.
ii. අථ නාගරාජා තස්ස තානි පුප්ඵානි දත්වා එවමාහ.
iii. එකදා තථාගතො තං වනං පාපුණි.
iv. සො අහං ධම්මං දෙසිස්සාමි තං සුණාථ.
v. පිතා පුත්තෙන සද්ධිං ගෙහං අගච්ඡි.

05. පහත දැක්වෙන වාක්‍ය පාලියට නගන්න.

i. පෙර අනුරාධපුර නම් නගරයක් විය.
ii. ඒ නගරයේ මහානාම නම් මහ තෙරනමක් වැඩ විසීය.
iii. ඒ කුමාරයා දිනපතා විහාරයට යයි.
iv. මම නැවෙන් ඉන්දියාවට ගියෙමි.
v. හැමදා මම බුද්ධශ්‍රාවකයෙක් වෙමි.